# අධ්‍යක්ෂ තනතුර

ශ්‍රී ලංකා පුරවැසියන් අතරින් සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින්ගෙන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ (Postgraduate Institute of Management - PIM) අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ නිකුත් කරන ලද ආඥා පනතක් මගින් 1986 වර්ෂයේදී ස්ථාපිත කරන ලදී. වර්තමානයේදී එය 2018 අංක 03 දරන PIM ආඥා පනත යටතේ පාලනය වේ. මෙම ආයතනය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අනුබද්ධව ක්‍රියාත්මක වන අතර, කළමනාකරණ හා පරිපාලන ක්ෂේත්‍රයන්හි පශ්චාත් උපාධි අධ්‍යාපනය, වෘත්තීය පුහුණුව, පර්යේෂණ හා සංවර්ධන කටයුතු සපයන ස්වයං මූල්‍යකරණ උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස ක්‍රියා කරයි.

**අධ්‍යක්ෂවරයාගේ වගකීම්**

අධ්‍යක්ෂවරයා ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියා, ප්‍රධාන අධ්‍යයන නිලධාරියා සහ ගණන් දීමේ නිලධාරියා ලෙස කටයුතු කරනු ඇත.

එමෙන්ම අධ්‍යක්ෂවරයා,
* කළමනාකරණ මණ්ඩලයේ නිල බලයෙන් සාමාජිකයෙකු සහ එහි සභාපතිවරයා ලෙසත්,
* ආයතනයේ අධ්‍යයන මණ්ඩලවල නිල බලයෙන් සාමාජිකයෙකු ලෙසත් කටයුතු කරනු ඇත.

කළමනාකරණ පශ්චාත් උපාධි අධ්‍යාපනය, පර්යේෂණ හා වෘත්තීය සංවර්ධනය තවදුරටත් ඉදිරියට ගෙන යාම සඳහා අධ්‍යයන, වෘත්තීය හා පරිපාලන නායකත්වය සැපයීම අධ්‍යක්ෂවරයාගෙන් අපේක්ෂා කෙරේ.

අයදුම්කරු කළමනාකරණය, පරිපාලනය හෝ අදාළ ක්ෂේත්‍රයක විශිෂ්ට අධ්‍යයන හා වෘත්තීය සුදුසුකම් සහිත, කැපී පෙනෙන ජයග්‍රහණ, නායකත්වය, පර්යේෂණ, පරිපාලන කටයුතු සහ වෘත්තීය දායකත්වයන් පිළිබඳ ප්‍රශංසනීය වාර්තාවක් සහිත ප්‍රමුඛ පෙළේ පුද්ගලයෙකු විය යුතුය.

**අයදුම්කරු,**

* ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු අතර,
* අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වන විට වයස අවුරුදු 63 ට අඩු විය යුතුය.

තෝරාගනු ලබන අපේක්ෂකයා කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ පූර්ණ කාලීන පදනම මත සේවය කළ යුතු අතර, පත්වීම් දිනයේ සිට වසර තුනක (03) කාලයක් හෝ වයස අවුරුදු 65 සම්පූර්ණ වන තෙක්, එයින් කලින් එළඹෙන අවස්ථාව දක්වා තනතුර දැරීමට නියමිතය. අධ්‍යක්ෂවරයාට වැටුප් කේතය U-AC5 යටතේ නියමිත වැටුප, එම වැටුප් කේතයට අදාළ දීමනා සහ අධ්‍යක්ෂ තනතුර සඳහා අදාළ අනෙකුත් වරප්‍රසාද හිමි වේ.

පහත සඳහන් ලේඛන අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුය:

1. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය (www.pim.sjp.ac.lk වෙතින් බාගත කළ හැක.)
2. ආයතනයේ ඉදිරි සංවර්ධනය සඳහා වන දැක්ම ප්‍රකාශයක් (Statement of Vision).
3. අධ්‍යක්ෂවරයා ලෙස පත් කළහොත් අත්කර ගැනීමට අපේක්ෂා කරන ප්‍රතිඵල හා ක්‍රියාමාර්ග පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක්.

වත්මන් අධ්‍යක්ෂවරයා අයදුම්කරුවෙකු නම් හෝ මීට පෙර ආයතනයේ අධ්‍යක්ෂ තනතුර දරා ඇති අයදුම්කරුවෙකු නම්, පෙර ධුර කාලය තුළ අත්කරගත් ජයග්‍රහණ සහ ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.

4. අයදුම්කරුගේ උපන් දිනය ඇතුළත් සම්පූර්ණ ජීව දත්ත සටහනක් (Curriculum Vitae). උප්පැන්න සහතිකයේ සහතික කළ පිටපතක්ද අමුණා තිබිය යුතුය.

5. අධ්‍යයන හා වෘත්තීය සුදුසුකම්වල සහතික කළ පිටපත් මෙන්ම, අදාළ වන පරිදි නායකත්වය, පර්යේෂණ ප්‍රකාශන, වෘත්තීය ජයග්‍රහණ, ඇගයීම් සහ පරිපාලන පළපුරුද්ද සම්බන්ධ ලේඛනගත සාක්ෂි.

6. රාජ්‍ය සේවයේ, සංස්ථාවක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ උසස් අධ්‍යාපන ආයතනයක සේවය කරන අයදුම්කරුවන්, අදාළ ආයතනයේ ප්‍රධානියා හරහා අයදුම්පත ඉදිරිපත් කළ යුතු අතර, පත්වීම ලැබුවහොත් අදාළ තනතුර භාර ගැනීම සඳහා ඔවුන් නිදහස් කළ හැකි බවට වන තහවුරු කිරීමක් ද ඉදිරිපත් කළ යුතුය.

තේරීම් ක්‍රියාවලිය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ (UGC) 2024 අංක 01 දරන චක්‍රලේඛය මගින් නියම කර ඇති ක්‍රියාපටිපාටියට අනුව සිදු කරනු ලැබේ.අදාළ චක්‍රලේඛය සහ PIM ආඥා පනත, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වෙබ් අඩවියෙන් බාගත කරගත හැක.

**අයදුම්පත් භාරදීම**

අයදුම්පත්,ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය, අංක 28, ලෙස්ලි රණගල මාවත, කොළඹ 08. යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් භාර දිය යුතුය. අයදුම්පත් 2026 ඔක්තෝබර් මස 30 වන දින ප.ව. 3.00ට හෝ ඊට ප්‍රථම අදාළ කාර්යාලයට ලැබෙන සේ ඉදිරිපත් කළ යුතුය. ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ "Application for the Post of Director" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය. අසම්පූර්ණ අයදුම්පත්, නියමිත අවසන් දිනය හා වේලාවෙන් පසුව ලැබෙන අයදුම්පත් හෝ ඉහත සඳහන් අවශ්‍යතා සපුරා නොමැති අයදුම්පත් සලකා බලනු නොලැබේ. මීට අමතරව, ඉහත සඳහන් සියළුම ලේඛන සහ වෙනත් උපකාරක ලේඛන තනි PDF ගොනුවක් ලෙස සකස් කර එහි මෘදු පිටපතක් sar@pim.sjp.ac.lk යන විද්‍යුත් තැපැල් ලිපිනයට 2026 ඔක්තෝබර් මස 30 වන දින ප.ව. 3.00ට හෝ ඊට ප්‍රථම යොමු කළ යුතුය.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී සහ කළමනාකරණ මණ්ඩලයේ ලේකම්

2026 ඔක්තෝබර් 09


PIM
Postgraduate Institute of Management
University of Sri Jayewardenepura

28, Lesley Ranagala Mawatha, Colombo 08,
Sri Lanka.

Tel: +94 11 2 689 639
Fax: +94 11 2 689 643
Web: www.pim.sjp.ac.lk
E-mail: sar@pim.sjp.ac.lk